# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2403/27 - 2024 සැප්තැම්බර් මස 25 වැනි බදාදා - 2024.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ අංක 106(1) සමග කියවිය යුතු 105(1) වගන්තිය යටතේ වන රීති.

ආචාර්ය **පී. නන්දලාල් වීරසිංහ,**
ශ්‍රී ලංකා මහ බැංකු පාලක මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින.
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ නව විශ්‍රාම යෝජනා ක්‍රමයෙහි රීති**

1. 1998.01.01 දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ලෙස පත් කරන ලද පුද්ගලයෙකුගේ විශ්‍රාම ප්‍රතිලාභවලට අදාළ ව, 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 10 (ආ) වගන්තිය සමග කියවිය යුතු 10 (ඇ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර ව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සාදන ලද පහත රීතිය 2024.09.11 දින සිට ක්‍රියාත්මක වන පරිදි අහෝසි කෙරේ.

*මහ බැංකු අධිපතිවරයාගේ විශ්‍රාම වැටුප*

*"වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, 1998.01.01 දින හෝ ඉන් පසු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා ලෙස පත් කරනු ලබන පුද්ගලයකු මෙම රීතිවල අරමුණු සඳහා සේවකයකු ලෙස සැලකිය යුතු අතර, 2015.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මුදල් නීති පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාර ව ඔහුට අවසන්වරට ගෙවූ මූලික වැටුපෙන් සියයට 74ට සමාන මාසික විශ්‍රාම වැටුපක් ඔහු සේවය කළ වසර ගණන නොසලකා ලබා ගැනීමට සුදුසුකම් ලබයි. කෙසේ වෙතත්, 2015.01.01 දිනට පෙර මහ බැංකු අධිපතිවරයකු ලෙස පත් කරන ලද පුද්ගලයකු විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුසුකම් ලබන්නේ 2015.01.01 දිනට පසුව ය.*

*එසේ වුව ද, හිටපු මහ බැංකු අධිපතිවරයකු සම්බන්ධයෙන් අධිකරණයක් ඉදිරියේ අපරාධ විමර්ශනයක් හෝ නඩු ක්‍රියාදාමයක් පවත්වනු ලබන අවස්ථාවක, එවැනි හිටපු මහ බැංකු අධිපතිවරයකුට විශ්‍රාම වැටුප් ගෙවීම එම විමර්ශන හෝ ක්‍රියාදාමයන් අවසන් වන තුරු අත්හිටුවිය යුතු ය.*

*එකී අපරාධ විමර්ශනයේ ප්‍රතිඵලයක් ලෙස හිටපු මහ බැංකු අධිපතිවරයා අපරාධ වරදකට වරදකරු කරනු ලැබුවහොත්, එවැනි හිටපු මහ බැංකු අධිපතිවරයකු විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් නොලබයි.”*

2. ඒ අනුව, මහ බැංකු අධිපති ලෙස පත් කර ඇති පුද්ගලයකු වෙත ගෙවනු ලබන විශ්‍රාම වැටුප් ගෙවීම් 2024.09.11 දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවනු ලැබිය යුතු අතර ඉහත සඳහන් ක්‍රියාත්මක කිරීමේ දිනෙන් පසු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උක්ත දැක්වූ කිසිදු විශ්‍රාම වැටුප් හිමිකම්පෑමක් සලකා නොබැලිය යුතු ය.

EOG 09 - 0173

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.